**මූතූර් ප්‍රාදේශීය සභාව**
**ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය**

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

සමාලෝචිත වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2011 ජුලි 27 දින විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර, ඉකුත් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2010 ඔක්තෝබර් 25 දින විගණනය සඳහා ඉදිරිපත් කර තිබුණි.

1.2 **මතය**

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරීම් අනුව මූතූර් ප්‍රාදේශීය සභාවේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2010 දෙසැම්බර් 31 දිනට මූතූර් ප්‍රාදේශීය සභාවේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

1.3 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.**

1.3.1 **ගණකාධිකරණ අඩුපාඩු.**

පහත දැක්වෙන ගණකාධිකරණ අඩුපාඩු නිරීක්ෂණය කෙරේ.

(අ) ප්‍රාදේශීය සභා පනතේ 172(2) ඡේදය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනවල විගණන ගාස්තු සඳහා ප්‍රතිපාදන සළසා නොතිබුණි.

(ආ) ස්ථාවර වත්කම් වටිනාකම රු.29,146,308 ක් මත ක්ෂය ප්‍රතිපාදන සළසා නොතිබුණි.

(ඇ) විවිධ පාර්ශවයන්ගෙන් පරිත්‍යාග ලෙස ලැබී ඇති ට්‍රැක්ටර් ට්‍රේලර්, වතුර පොම්ප, රෝද දෙකේ ට්‍රැක්ටර්, ලී බඩු සහ කාර්යාලයීය උපකරණවල වටිනාකම් ගණන් බලා මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබුණි.

1.3.2 **ගෙවියයුතු ගිණුම්**.

2010 දෙසැම්බර් 31 දිනට අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ගෙවියයුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.1,450,986 ක් විය.

1.3.3 **බැංකු ගිණුම්**

බැංකු සැසඳුම් සඳහා සිදු කරන ලද ගැළපීම්වලට අදාළ තොරතුරු පහත දැක්වේ.

| විස්තරය | අවස්ථා ගණන | කාල විශ්ලේෂණ<br>මාස 06ට වැඩි මාස 12ට අඩු කාලය | වර්ෂ 01 සිට 03 | වර්ෂ 03ට වැඩි | එකතුව |
|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. |
| 1. උපලබ්ධි නොවු තැන්පතු | 01 | -- | -- | 400 | 400 |
| 2. නිකුත් කරන ලද නමුත්, ගෙවීම් සඳහා ඉදිරිපත් නොකරන ලද චෙක්පත්. | 42 | 6,150 | 166,718 | 126,267 | 299,135 |
| | | 6,150 | 166,718 | 126,667 | 299,535 |

## 1.3.4 අවිනිශ්චිත ගිණුම්.

2010 දෙසැම්බර් 31 දිනට අවිනිශ්චිත ගිණුම්වල බැර ශේෂයන්වල එකතුව රු.16,574 ක් ද විය.

## 1.3.5 විගණනය සඳහා සාක්ෂි නොවීම.

(අ) **පිළිතුරු නොලත් විගණන විමසුම්.**

2010 දෙසැම්බර් 31 දින වන විට විගණන විමසුම් 96 කට පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණු අතර, එකී විමසුම්වලට භාජනය වු ගණනය කළ හැකි ගනුදෙනුවල වටිනාකම රු.2,247,197 කි.

(ආ) **තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම.**

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා, එකතුව රු.778,780 ක් වු ගනුදෙනු විගණනයේ දි සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

## 1.3.6 අනුකූල නොවීම්.

පහත දැක්වෙන නීති, රීති, රෙගුලාසි, විධි විධානවලට හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් විගණනයේ දි නිරීක්ෂණය විය.

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව. | අනුකූල නොවීම. |
|---|---|---|
| (අ) | **ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති.** | |
| (i) | 11 කොටසේ 6 වන පරිච්ජේදය | ප්‍රාදේශීය සභාව නිශ්චිල හා චංචල දේපළ සඳහා වෙනම ලේඛනයක් පවත්වා නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ii) | 1 පරිච්ඡේදයේ 5(xi) ඡේදය | මුදල් හා ගබඩා සම්බන්ධයෙන් රක්ෂණ ආවරණයක් ලබා ගෙන නොතිබුණි. |
| (iii) | 1 පරිච්ඡේදයේ 5(xii) ඡේදය | මුදල් හා ගබඩාභාර නිලධාරින්ගෙන් ප්‍රමාණවත් ඇපකරයක් ලබා ගෙන නොතිබුණි. |
| (iv) | vii පරිච්ඡේදයේ 10(159) ඡේදය | සමාලෝචිත වර්ෂයේ මාසික ආදායම් වාර්තා විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. |
| (v) | vii පරිච්ඡේදයේ 4(153) ඡේදය | හිඟහිටි ආදායම් වාර්තා විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. |
| (vi) | viii (3) පරිච්ඡේදය | ප්‍රසිද්ධ තරඟකාරීත්වයෙන් තොරව වැඩ හා සේවා ලබා දී තිබුණි. |

(ආ) පළාත් සභා මුදල් රීති.
-----------------------

| | | |
|---|---|---|
| (i) | රීති අංක 345 | රු.302,102 ක වටිනාකමැති ගෙවීම් සඳහා ඉදිරිපත් නොකළ චෙක්පත් සම්බන්ධයෙන් ගතයුතු ක්‍රියා මාර්ග ගෙන නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ඇ) | මුදල් රෙගුලාසි 1645 | වාහන ධාවන සටහන් විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. |
| (ඈ) | 2006 අංක 10 දරන දේශීය ආදායම් පනත. | උපයන විට ගෙවීමේ බදු රු.5,200 ක් ආයතනවලින් අය කර ගෙන නොතිබුණි. |

2. <u>මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය</u>

2.1 <u>මූල්‍ය ප්‍රතිඵලය</u>

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්ථන වියදම ඉක්මවූ ආදායම රු.2,887,356 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්ථන වියදම ඉක්මවූ ආදායම රු.860,579 ක් විය.

2.2 <u>ආදායම් පරිපාලනය.</u>

2.2.1 <u>ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් සහ හිඟ හිටි ආදායම්.</u>

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2010 | දෙසැම්බර් 31 දිනට | 2009 | දෙසැම්බර් 31 දිනට |
|---|---|---|---|---|
| | -------- | | -------- | |

| | ආදායම් විෂයය | ඇස්තමේන්තු ගත | තථ්‍ය | සමුච්චිත හිඟය | ඇස්තමේන්තු ගත | තථ්‍ය | සමුච්චිත හිඟය |
|---|---|---|---|---|---|---|---|
| | | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| (i) | වරිපනම් හා බදු | 565 | 613 | 3,329 | 565 | 305 | 5,126 |
| (ii) | බදු කුළී | 5,900 | 4,202 | 5,217 | 2,560 | 4,072 | 4,373 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 500 | 381 | 81 | 460 | 584 | 163 |
| (iv) | වෙනත් ආදායම් | 22,540 | 22,030 | -- | 3,303 | 367 | -- |

2.2.2 <u>උසාවි දඩ මුදල්</u>

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ පරිච්ඡේද 129(2)(අ) හි උපලේඛන 1 හී දැක්වෙන ප්‍රතිපාදන අනුව, විවිධ ආඥා පනත් යටතේ මහේස්ත්‍රාත් අධිකරණය විසින් පනවනු ලබන දඩ මුදල් අය කර ගැනීම සඳහා සභාව විසින් මහේස්ත්‍රාත් අධිකරණය වෙත බිල්පත් ඉදිරිපත් කර නොතිබුණි. සභාව විසින් ලැබියයුතු උසාවි දඩ මුදල් ගණනය කර ගිණුම්ගත කර නොතිබුණි.

2.2.3 <u>මුද්දර ගාස්තු</u>

රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගෙන් ලැබියයුතු මුද්දර ගාස්තු ගණනය කර ගිණුම්ගත කර නොතිබුණි.

2.3 <u>වියදම් ව්‍යුහය</u>

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂය සඳහා සභාවේ අයවැයගත හා තථ්‍ය වියදම අදාල විචලනයන්ද සමඟ පහත දැක්වේ.

| | 2010 | | | 2009 | | |
|---|---|---|---|---|---|---|
| <u>වියදම් විෂයය</u> | <u>අයවැයගත</u> | <u>තථ්‍ය</u> | <u>විචලනය</u> | <u>අයවැයගත</u> | <u>තථ්‍ය</u> | <u>විචලනය</u> |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| <u>පුනරාවර්තන වියදම්</u> | | | | | | |
| පෞද්ගලික පඩිනඩි | 22,223 | 21,106 | 1,117 | 20,874 | 19,587 | 1,287 |
| අනෙකුත් | 4,799 | 3,171 | 1,628 | 4,204 | 2,844 | 1,360 |
| උප එකතුව | 27,022 | 24,277 | 2,745 | 25,078 | 22,431 | 2,647 |
| ප්‍රාග්ධන වියදම් | 2,475 | 3,053 | (578) | 4,878 | 4,778 | -- |
| මුළු එකතුව | 29,497 | 27,330 | 2,167 | 29,956 | 27,309 | 2,647 |

2.4 <u>අධිභාර.</u>

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(3) වගන්තියේ විධිවිධාන යටතේ වගකිවයුතු අයවලුන්ට එරෙහිව මා විසින් පනවන ලද අධිභාර අනුව, 2010 දෙසැම්බර් 31 දිනට අය කර ගැනීමට තිබුණු අධිභාර අගය රු.15,276 ක් විය.

2.5 <u>මානව සම්පත් කළමණාකරණය</u>

2.5.1 <u>අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව</u>

2010 දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත සහ තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| සේවක ශ්‍රේණිය | අනුමත | තථ්‍ය | ඌනතාවය/ අතිරික්තතාවය |
|---|---|---|---|
| මාණ්ඩලික | 01 | -- | 01 |
| ද්විතියික | 25 | 19 | 06 |
| ප්‍රාථමික | 55 | 55 | -- |
| වෙනත් (අනියම්, තාවකාලික) | -- | 25 | (25) |
| එකතුව | 81 | 99 | (18) |

2.6 <u>වත්කම් කළමනාකරණය.</u>

2.6.1 (අ) <u>නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත භෞතික සම්පත්</u>

නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිතව පැවති භෞතික සම්පත් පිළිබඳ නියැදි විගණන පරීක්ෂණවල දි අනාවරණය වු වත්කම් පිළිබඳ විස්තර පහත පරිදි වේ.

| | අයිතම | අයිතම සංඛ්‍යාව | වටිනාකම රු. |
|---|---|---|---|
| (අ) | පුටු | 79 | අගය සඳහන් වී නොමැත. |
| (ආ) | ඡායා පිටපත් යන්ත්‍රය කැනන් 2010 J | 01 | |
| (ඇ) | ඡායා පිටපත් යන්ත්‍රය කැනන් NP 1225 | 01 | |
| (ඈ) | රෝනියෝ යන්ත්‍රය HRO | 01 | |
| (ඉ) | වායු සමීකරණ යන්ත්‍රය එල් . ජී. | 01 | |
| (ඊ) | නිපන් කලර් ප්‍රින්ටර් | 01 | |
| (උ) | විධායක පුටුව | 01 | |
| (ඌ) | කුෂන් පුටු | 59 | |

2.6.2 <u>ලැබිය යුතු ගිණුම්</u>

2010 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.891,303 ක් විය.

2.6.3 <u>අයවීමට ඇති සේවක ණය</u>

2010 දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව තිබූ සේවක ණය අත්තිකාරම් ශේෂවල එකතුව රු.5,209,413 ක් වූ අතර, අවුරුදු 01 ක කාලයක් ඉක්මවා අයවීම් හිඟහිටි ගිණුම් ශේෂවල එකතුව රු.930,263 ක් විය.

2.6.4 <u>අචල ජංගම වත්කම්.</u>

2010 දෙසැම්බර් 31 දිනට අවුරුදු 01 ක කාලයක් ඉක්මවා අචලව පවතින වත්කම්වල අගය රු.48,587 ක් විය.

2.6.5 **<u>සමීක්ෂණය නොකළ වත්කම්.</u>**

භෞතික පරීක්ෂණ / සමීක්ෂණ මණ්ඩල වාර්තා මගින් තහවුරු නොවූ 2010 දෙසැම්බර් 31 දිනට පොත් අගය මත ගණන් බැලූ වත්කම්වල වටිනාකම රු.4,443,627 ක් විය.

2.7 <u>වාහන උපයෝජනය.</u>

පහත සඳහන් නිරීක්ෂණයක් කෙරේ.

(අ) වාහන ලොග් පොත් විධිමත් පරිදි පවත්වා ගෙන ගොස් නොතිබුණි.

(ඇ) දෛනික ධාවන සටහන්වල ගිය දුර, අදාළ රාජකාරි අවශ්‍යතාවය ආදි තොරතුරු ඇතුළත් කර නොතිබුණි.

2.8 <u>හඳුනා ගත් පාඩු හා හානි.</u>

නියැදි විගණන පරීක්ෂණවල දී සහ සභාව පවත්වා තිබූ තොරතුරු අනුව, රු.3,674,902 ක අගයකට පාඩු හා හානි අනාවරණය වී ඇත.

2.9 <u>අභ්‍යන්තර විගණනය.</u>

ආයතනය තුළ ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි.

3. <u>පද්ධති හා පාලන</u>

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරේ.

(අ) ගිණුම්කරණය
(ආ) ආදායම් පරිපාලනය
(ඇ) අයවැය පාලනය
(ඈ) ස්ථාවර වත්කම් පාලනය